" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

ISO 9001

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை. பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/1 /FI/1 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.08./17 |
|---|---|---|---|---|---|

<u>පිරිස් හා පුහුණු චක්‍රලේඛ - 01/2022</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභාව
ලේකම් ( පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය ) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන), අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් /පරිපාලන නිලධාරි

<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් නව තනතුරු සඳහා ස්ථිරව මුදා හැරීම.</u>

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් නව තනතුරක් භාර ගැනීම සඳහා, සේවයේ යෙදී සිටි තනතුරෙන් ස්ථිරව මුදා හැරීම සඳහා, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට සහ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඇතැම් අයදුම්පත් වසරකටත් අධික කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කරන බවත්, මෙම ප්‍රමාදයන් සඳහා හේතු වශයෙන් සනාථ කිරීමේ ලේඛණ නොමැති වීම, කාර්යාල වසා තැබීම, අදාල ලේඛණ වල අඩුපාඩු ආදී පිළිගත නොහැකි හේතූන් ඉදිරිපත් කරන බවත් නිරීක්ෂණය වී ඇත.

02. මෙම හේතුව මත අදාළ නිලධාරීන් සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වන අපහසුතාවය මඟහරවා ගැනීම පිණිස, අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී මෙ දක්වා වූ සියළුම අයදුම්පත් එකී අයදුම්පත් ප්‍රමාදවීමට අදාළ සත්‍ය හා නිශ්චිත හේතූන් පිළිබඳ පැහැදිළි කිරීමක් සහිතව නොපමාව ඉදිරිපත් කරන මෙන් දන්වමි. එමෙන්ම මින් ඉදිරියට එවැනි අයදුම්පතක් ඉදිරිපත් කිරීම නව තනතුරට පත්වූ දින සිට මාස 3 ක් ඉක්මයාමට ප්‍රථම ඉදිරිපත් කළ යුතු බවත්, මාස 3 කට අධික කාලයක් ප්‍රමාද වන අයදුම් පත් සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් වගකිව යුතු බවත් දැනුම් දෙමි.

03. තව ද මෙ සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී " බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයෙකු පළාත් සභා රාජ්‍ය සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදාහැරීම" මැයෙන් යුත් බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය සම්බන්ධයෙන් අවධානය යොමු කර එහි 130 වගන්තිය ප්‍රකාරව මුදාහැරීමට ඉල්ලීම කරනු ලබන්නේ නිලධාරියාගේ ඉල්ලීම මත නම් අංක 10 පරිශිෂ්ඨය ප්‍රකාරව නියමිත ලේඛණ ද සමඟ මේ සමඟ යොමු කර ඇති පිරික්සුම් ලැයිස්තුව සමඟ ඉදිරිපත් කල යුතුය.

04. ඉහත උපදෙස් පිළිබඳව ඔබ කාර්යාලයේ නිලධාරීන් මෙන්ම ඔබ යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන/කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ජේ.එම්. සිරියන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් නව තනතුරු සඳහා ස්ථිරව මුදා හැරීම

## පිරික්සුම් ලැයිස්තුව ( Check List)

| අනු අංකය | ලේඛණය | ඇත | නැත | වෙනත් |
|---|---|---|---|---|
| 1 | බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 130 වගන්තිය අනුව අංක 10 පරිශිෂ්ඨය | | | |
| 2 | නිලධාරියාගේ මුල් පත්වීමේ ලිපියෙහි සහතික කළ පිටපතක් | | | |
| 3 | නිලධරයාගේ මුල් පත්වීම ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 4 | බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (1) අනුව අදාළ නිලධරයා පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර කර නොමැති විට 131 (11) අනුව පළාත් සභා රාජ්‍ය සේවයෙන් මුදා හරින ලෙස ඉල්ලා සිටින දින වන විට සමත්ව සිටිය යුතු දෙපාර්තමේන්තු පරීක්ෂණ හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී නොමැති විට අදාළ ආයතන ප්‍රධානී විසින් මුදා හැරීම නිර්දේශ කිරීමේ සහතිකය | | | |
| 5 | නිලධරයාගේ මුල් පත්වීම් ලිපිය බස්නාහිර පලාත් රාජ්‍ය සේවයේ නොවේනම් බස්නාහිර පලාත් රාජ්‍ය සේවයට පත් කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක් ( බස්නාහිර පලාත් රාජ්‍ය සේවයට පත් කිරීමේ ලිපිය) | | | |
| 6 | නිලධරයා රාජකාරි වලින් නිදහස් කිරීමේ ලිපියෙහි සහතික කළ පිටපතක් | | | |
| 7 | නිලධරයා නව තනතුරට පත් කිරීමේ විධිමත් පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් | | | |
| 8 | නිලධරයා නව තනතුරේ රාජකාරි භාර ගැනීමේ සහතික කළ පිටපතක් | | | |
| 9 | බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (iii) සිට (xii) දක්වා කරුණු සපුරා ඇති බැවින් නිලධරයා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අදාළ තනතුරින් මුදාහැරීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ සහතිකය | | | |
| 10 | බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XII වෙනි පරිච්ඡේදයේ 131 (xiii) අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයා සේවය කරමින් සිටින දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟත්වය සහිත ලිපිය. | | | |